**විසර්ජන ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව -2011 වර්ෂය**

---------------------------------------------------------------

1.1 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිළිඳුකම අඩුකිරීම සඳහා වන මූලපිරීම

(ආ) මැතිවරණ සම්බන්ධීකරණය

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය

(ඈ) ආපදා සහන ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපෘතීන් පරිපාලන

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘතීන් පරිපාලනය හා මහ පෙන්වීම

(ඊ) ආදායම් එකතු කිරීම

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) | අත්තනගල්ල | (ඉ) | ගම්පහ | (එ) | මහර | (ක) | වත්තල |
| (ආ) | බියගම | (ඊ) | ජාඇල | (ඒ) | මිනුවන්ගොඩ | | |
| (ඇ) | දොම්පෙ | (උ) | කටාන | (ඔ) | මීරිගම | | |
| (ඈ) | දිවුලපිටිය | (ඌ) | කැලණිය | (ඕ) | මීගමුව□ | | |

1.3 **විගණන විෂය පථය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 පෙබරවාරි 14 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.4 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

උස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 613,973,600 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.605,756,290 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 8,217,310ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.34 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | 2011 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 547,025,000 | 564,673,600 | 7,104,862 | 1.26 |
| මූලධන | 49,300,000 | 49,300,000 | 1,112,448 | 2.26 |
| එකතුව | 596,325,000 | 613,973,600 | 8,217,310 | |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 21 කින් රු.2,824,825,117 ක් හා දෙපාර්තමේන්තු 13 ක් විසින් රු.2,715,360,877 ක් වශයෙන් එකතුව රු.5,540,185,994 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඉන් පිළිවෙලින් රු.2,691,905,665 ක් හා රු.2,486,812,833 ක් වශයෙන් එකතුව රු.5,178,718,498 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.361,467,496 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 54,950,000 | 54,643,563 | 57,500,000 | 59,252,451 | 234,000,000 | 214,821,305 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.495,967,625 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.** |
| 6003/0000/00/0032/0000/000 | 495,967,625 |

## 2.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2011 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.5 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

(i) වාහන සඳහා ලොග් පොත්, වාහන ලිපිගොනු සහ රාජකාරි ගමන් සඳහා වාහන වෙන් කිරීම් ලේඛන ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.675,818 ක ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් එකකට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් එකකට 2012 ඔක්තෝබර් 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,957,311ක් විය.

(ආ) **සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එවැනි සංයුක්ත සැලැස්මක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

(ඇ) **වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

ඉහත (ආ) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඈ) **වාර්ෂික කාර්ය සාධන වාර්තා**

ඉහත (ආ) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2012 සැප්තැම්බර් 21 දිනදීය.

(ඉ) **වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම 2011 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

(ඊ) **පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ රු.48,316,883 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(උ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------------

විෂය අංක 25601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,658,170 ක් ව අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

2.5 **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් වාහන | 02 | මාස 4½ -7 දක්වා |

## 2.6 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි වලට යොමු | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 1646 | වාහන භාර නිලධාරීන් විසින් දෛනික ධාවන සටහන් සහ ගමන් පිළිබඳ මාසික සංසිද්ධි වාර්තා ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් සමහර මාසවල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (I) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1.1 ඡේදය | දිස්ත්‍රික් ලේකම් වෙත නිල වාහන 2 ක් අනුයුක්ත කර තිබුණි. |
| (II) 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | නිල වාහන අනුයුක්ත කර ඇති නිලධාරීන් චක්‍රලේඛයෙහි ඇමුණුම 2 පරිදි තබා ගත යුතු වූ වාර්තා පවත්වා නොතිබුණි. |
| (III) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන සීමාවන්ට යටත්ව රාජකාරි අවශ්‍යතා සපුරාගත යුතු අතර අතිරේක ඉන්ධන ලබාගැනීමේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් 2011 වර්ෂයේදී ඉන්ධන ඇණවුම්පත් මගින් අවස්ථා 04 කදී ලබා ගෙන තිබූ ඉන්ධන ලීටර් 320 සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (IV) | 2005 මාර්තු 23 දිනැති අංක එච්ඒ/පීඑන්/4/2/ 2003 සහ 2006 සැප්තැම්බර් 20 දින අංක එච්ඒ/පීඑන්/5/11 දරන චක්‍රලේඛය | ග්‍රාම නිලධාරීන් කාර්යාලයේ සහ ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදෙන විට නිල ඇඳුමින් සැරසී නිල ලාංඡනය පැළඳ සිටිය යුතු වුවත්, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කාර්යාල පරීශ්‍ර වාර්තා අනුව රාජකාරී අවස්ථා වලදී සමහර ග්‍රාම නිලධාරීන් නිල ඇඳුමින් සැරසී නොසිටි අතර ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | **දිස්ත්‍රික් ලේකම්ගේ චක්‍රලේඛ**<br>-------------------- | |
| | 2007 ජුනි 27 දිනැති අංක 1/8/18 දරන ලිපිය | සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම වසරක් තුළදී අවම වශයෙන් 4 වතාවක්වත් පරීක්ෂා කළයුතු වුවත්, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කාර්යාල 133 න් කාර්යාල 112 ක් පරීක්ෂා කර නොතිබුණි. |

2.7 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

පහත නිරීක්ෂණ කෙරේ.

(අ). <u>ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම</u>

2010 වර්ෂයේ එක ගමකට එක වැඩක් යන සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ දොම්පෙ පාදේශීය ලේකම් කාර්යාලය පහත සඳහන් ව්‍යාපෘති යෝජනා අනුමත කර ගෙන 2011 අඛණ්ඩ ව්‍යාපෘති ලෙස දක්වමින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද ඒවා කයාත්මක නොකර එම ප්‍රතිපාදනයන් වෙනත් ව්‍යාපෘති සඳහා යොදවා තිබුණි.

| | **ව්‍යාපෘතිය**<br>---------- | **ඇස්තමේන්තුගත පිරිවැය**<br>----------------<br>රු. | **ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන්**<br>----------------- |
|---|---|---|---|
| (i) | පහළ මාපිටිගම කිඹුල්විල වත්ත වැව ප්‍රතිසංස්කරණය කිරීම | 1,000,000 | රන් අරුණ ව්‍යාපෘතිය යටතේ මෙය ක්‍රියාත්මක කර තිබීම |
| (ii) | මොරහේන කිඹුල්විල වත්ත වැව ප්‍රතිසංස්කරණය කිරීම | 1,000,000 | - එම - |

(ආ) <u>ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්</u>

2011 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 2315න් 2011 දෙසැම්බර් 31 දිනට නිම නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව 296 ක් විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | නිම නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ යුතු දිනය | 2011 දෙසැම්බර් 31 දිනට වියදම |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. | | | | රු. |
| පෙර පාසල් සංවර්ධනය | 16,525,573 | 264 | 01 | 2011.12.31 | 15,131,487 |
| පාසල් සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම | 204,151,913 | 1062 | 93 | 2011.12.31 | 171,810,964 |
| ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 461,536,074 | 561 | 31 | 2011.12.31 | 351,967,337 |
| ගම නැගුම (විශේෂ) ව්‍යාපෘති | 19,182,622 | 33 | 9 | 2011.12.31 | 16,443,922 |
| සුළු වාරිමාර්ග | 185,137,683 | 386 | 156 | 2011.12.31 | 98,855,566 |
| රන් අරුණ | 1,300,000,000 | 09 | 06 | 2011.12.31 | 135,401,000 |
| | | 2315 | 296 | | |

2.8 <u>අවිධිමත් ගනුදෙනු</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ භූගෝලීය තොරතුරු පද්ධති සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ගම්පහ දිස්ත්‍රික්කය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියක් සැකසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ තොරතුරු සිතියම්ගත කිරීම වෙනුවෙන් සහභාගී වූ කැළණිය විශ්ව විද්‍යාල සිසුන් සහ ආචාර්යවරුන් වෙනුවෙන් වූ රු.2,647,500 ක මුදල චෙක්පතකින් නොගෙවා එක් පුද්ගලයෙකු වෙත මුදලින් ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘති කටයුතුවල යෙදුන විශ්ව විද්‍යාල සිසුන් වෙත 2010 නොවැම්බර්, දෙසැම්බර් මාස 2 සඳහා දීමනා ගෙවීමට 2010 ඔක්තෝබර් 14 දින ලබා දී තිබූ රු.2,500,000 ප්‍රතිපාදනවලින් 2010 නොවැම්බර් සිට 2011 අප්‍රේල් දක්වා ව මාස 4 ක් සඳහා අවස්ථා 19 කදී රු.2,187,750 ක් ගෙවා තිබුණි

(ඇ) මෙම ව්‍යාපෘතිය 2010 ජුනි මස ආරම්භ කර තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණ බැවින් අවසන් කළ යුතු දිනය ඉදිරිපත් කර ඇති වාර්තා අනුව පැහැදිලිව දක්වා නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති යෝජනාවේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති උපදේශන කමිටුවක් පත්කර නොතිබුණි.

2.9 <u>කළමනාකරණ දුර්වලතා</u>

2009 සැප්තැම්බර් 10 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී කර තිබූ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ, ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව - වර්ෂය | විගණකාධිපති වාර්තාවට යොමුව - ඡේද අංකය | නිරීක්ෂණය/ තීරණය/විධානය | ක්‍රියාකිරීම්/වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| 2006 | 9.2 කළමනාකරණ හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම | සියලුම විගණන විමසුම් සම්බන්ධයෙන් සහ කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට පියවර ගන්නා ලෙස | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයට අනුව කමිටු නිසි පරිදි ක්‍රියාත්මක නොවුණ අතර, 2010 සහ 2011 වර්ෂ වලදී වර්ෂයකට එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.තවද, නිකුත් කර තිබෙන විගණන විමසුම්වල සඳහන් කරුණු නිවැරදිකර ගැනීමේ මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය. |
| 2006 | 10.8 <u>කළමනාකරණ දුර්වලතා</u> කැළණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයට අයත් පොදු ගොඩනැගිලිවල ග්‍රාම නිලධාරී කාර්යාල 16 ක් පිහිටුවා තිබුණු අතර ඒ සඳහා වර්ෂ ගණනාවක සිට කාර්යාල දීමනා ගෙවා තිබුණි. | කාර්යාල දීමනා ආපසු අයකර නොගත හොත් අදාළ ග්‍රාම සේවා නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන ලෙස | ගෙවා තිබුණු කාර්යාල දීමනා ග්‍රාම නිලධාරීන්ගෙන් ආපසු අයකර ගෙන නොතිබුණි. |

2.10 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 51 | 49 | 02 |
| (ii) | තෘතික මට්ටම | 26 | 19 | 07 |
| (iii) | ද්විතික මට්ටම | 1675 | 1432 | 243 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 128 | 110 | 18 |
| | එකතුව | 1880 | 1610 | 270 |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 270 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

2.11 **අභ්‍යන්තර පාලනය**

(අ) **අභ්‍යන්තර විගණනය**

2011 අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහනට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 න් කාර්යාල 5 ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ විගණන කාල සටහනට අනුව මාසික ඉදිරි වැඩසටහන්ද සකස් කර නොතිබුණි.

(ආ) 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඊ/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයට අනුව කාර්තුවකට අවම වශයෙන් එක් වතාවක් විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවද, 2011 වර්ෂය වෙනුවෙන් එක් වතාවක් පමණක් කමිටුව රැස්වී තිබුණි.